GMOA

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

18-09-2012

මාධ්‍ය නිවේදනය

**"රාජ්‍ය සේවයේ සුවිශේෂි සේවාවන් ඉටු කරන සියළුම නිලධාරීන් සුවිශේෂි වැටුප් ස්ථරයන් හි පිහිටු විය යුතුය"**

මෑත වකවානුව තුල ඇතැම් රාජ්‍ය නිලධාරීන් සුවිශේෂි ස්ථානයක පිහිටුවා කටයුතු කල යුතු යන්න කතාබහට ලක් වී ඇත. ශ්‍රී ලංකාවතුල දශක ගණනාවක් තිස්සේ වැටුප් විෂමතාවයන් සහ අනෙකුත් වැටුප් සම්බන්ඳ ගැටළු හේතුවෙන් විශාල අර්බුධ සංඛාවක් පැවතුනි. වැටුප් හා සම්බන්ධ වු වෘත්තිය සමිති ක්‍රියාමාර්ග ඉතා බහුල වු අතර රාජ්‍ය සේවයේ ඵලදායිතාවය සඳහා මෙය ඉතාමත් අහිතකර බලපෑමක් ගෙන දුනි. එවන් පසුබිමක් යටතේ 2006 වර්ෂයේදි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ප්‍රතිපත්තියක පිහිටුවා ජාතික වැටුප් ප්‍රතිපත්තියක් වශයෙන් එළි දක්වන ලදි.

ජාතික වැටුප් ප්‍රතිපත්තිය මගින් සියළුම රාජ්‍ය සේවකයින් ප්‍රධාන කාණ්ඩ 4ක් යටතේ කාණ්ඩ ගතකර උපරිම හා අවම වැටුප් නිර්ණායක මත පිහිටුවා වැටුප් නිර්ණය කරන ලදි. එහිදි යම් විද්‍යාත්මක ක්‍රමවේදයක් මගින් මෙම කාණ්ඩගත කිරීම සිදුකරන ලද අතර ඉහලම කාණ්ඩය යටතේ විධායක නිළයන් හොබවන නිලධාරීන් කාණ්ඩගත කරන ලදි. එනම් ඉංජිනේරුවරුන්, වෛද්‍යවරුන් ,ජ්‍යේෂ්ඨ පරිපාලන නිලධරීන්, නිති නිලධාරීන්, විනිශ්චයකාරවරුන් ඇතුලු සුවිශේෂි කාර්යභාර්යයක් රාජ්‍ය සේවයේ සිදු කරනු ලබන නිලධාරීන් කාණ්ඩගත කර ඇත. ඒ අනුව 2006 වර්ෂයේදි ඉදිරිපත් කරන ලද රාජ්‍ය වැටුප් ප්‍රතිපත්තිය මගින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය තුල සුවිශේෂි නිලධාරීන් හදුනාගෙන ඔවුන්ව සුවිශේෂි ස්ථානයන් හි පිහිටුවා ඇත. නමුත් අවම හා ඉහලම වැටුප් අතර අනුපාතය 1:4 යන අගයෙහි රඳවා ඇති තත්ත්වයක් තුල මෙවැනි සුවිශේෂි කාර්යභාරයයක් ඉටු කරනු ලබන නිලධාරීන්ට ඔවුන් ලබා දෙන සේවාව සඳහා ප්‍රමාණාත්මක වැටුපක් නොලැබේ.

තවද මෙහි එක් කාණ්ඩයක් ඉතා සුවිශේෂ යයි සලකා රාජ්‍ය වැටුප් ප්‍රතිපත්තිය තුලින් ඉවත් කර ගැනිම සිදු වුවහොත් 2006 වර්ෂයට පෙර පැවති වැටුප් සම්බන්ද අවිනිශ්චිතභාවයට පත්වීම නොවැලැක් විය හැකි වන්නේය. ඒ හරහා නැවතත් වෘත්තිය ක්‍රියාමාර්ග ඇති වී රාජ්‍ය අංශයේ පිරිහිමටද හේතුවක් විය හැක. එම නිසා 2006 වර්ෂයේදි නිර්මාණය කරන ලද ජාතික වැටුප් ප්‍රතිපත්තිය මත පිහිටුවා සියළුම රාජ්‍ය අංශයේ නිලධාරීන්හට වැටුප් වැඩි කිරීම සිදුකල යුතුබව රජයේ වෛද්‍ය නිලධරීන්ගේ සංගමය අවධාරණය කර සිටියි.

ඒ සඳහා කලයුතු වන්නේ උපරිම හා අවම වැටුප අතර අනුපාතය 1:12 දක්වා වැඩි කිරීම බව තවදුරටත් අප අවධාරණය කර සිටිමු. එමගින් පහලම කාණ්ඩයේ සිටින සේවකයාගේ සිට ඉහලම සුවිශේෂි කාණ්ඩයේ සිටින සේවකයා දක්වා සාධාරණ වැටුපක් ලබා ගත හැකි බව විශ්වාස කරමු.

ස්තුතියි

වෛද්‍ය නලින් ආරියරත්න
සහකාර ලේකම්

| | | |
|---|---|---|
| වැඩි විස්තර - | වෛද්‍ය නලින් ආරියරත්න | 0714800942 |
| | වෛද්‍ය නවීන් ද සොයිසා | 0718582444 |